CPA

CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# වැලිවේරියේ ප්‍රචණ්ඩත්වය පිළිබඳව වූ ප්‍රකාශය

***2013 අගෝස්තු 6 වනදා, කොළඹ, ශ්‍රී ලංකාව*** : පසුගිය 2013 අගෝස්තු 1 වනදා, බ්‍රහස්පතින්දා, බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ වැලිවේරියේදී සිදුවූ විපත්දායක සිදුවීම් වෙත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැඩි බිය සහ කණසල්ලෙන් යුතුව සිය අවධානය යොමු කරයි. ශ්‍රී ලංකාවේ නිරායුධ පුරවැසියන් විසින් තම විරෝධය පෑමේ ප්‍රජාතාන්ත්‍රික අයිතිය භාවිත කරන විට ඔවුන් වෙත ආරක්ෂක හමුදා විසින් කඳුලුගෑස් ගැසීම, වෙඩි තැබීම හා මරණයන් සිදු කිරීම පශ්චාත් යුධ සමයේදී සිදුවූ පළමු වතාව මෙය නොවේ. කටුනායක අපනයන ප්‍රවර්ධන කලාපයේදී 2011දී ද හලාවත දී 2012 දී ද සිදුවූ එවැනි සිදුවීම් වලදී එක් අහිංසක පුද්ගලයකු බැගින් මරණයට පත්විය. එමෙන්ම සිදුවීම වාර්තා කළ මාධ්‍ය කාර්ය මණ්ඩලිකයන් හට අඩන්තේට්ටම් කිරීම, ඔවුන්ගේ උපකරණ අධිකාරීන් විසින් අත්පත්කර ගැනීම, ඒවාට අලාභ හානි කිරීම හෝ විනාශ කිරීම යනාදිය ද සිදුවිය. වැලිවේරිය සිදුවීම්වලදී මියගිය සංඛ්‍යාව දැනට 03 දෙනෙකුව පවතින අතර විශාල පිරිසකට තුවාල සිදුවී ඇත.

මෙසේ නිරායුධ පුරවැසියන් මරාදැමීම - වැලිවේරිය සිදුවීම්වලදී මෙසේ මරා දැමුනේ ඍජු ලෙස විරෝධයට  සම්බන්ධ නොවූ තරුණ ශිෂ්‍යයන් දෙදෙනෙකු බව වාර්තාවේ - අප රටෙහි නීතියේ ආධිපත්‍යය බිඳවැටීම ඛේදජනක හා ලජ්ජාව දනවන සුළු ආකාරයෙන් සිහිපත් කරවන්නක් වෙයි. එමෙන්ම ඊටත් වඩා වැදගත් වන්නේ එය පුරවැසියන් විසින් තමන්ගේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් භාවිත කිරීම පිළිබඳව වන රජයේ භාවමය නැමියාව සහ ආකල්පය සිහිපත් කරවන්නක් වීමයි. නීතියේ ආධිපත්‍යය හා රජය විසින් නීතිය හා සාමය පවත්වාගෙන යාම පිළිබඳව වූ බරපතල සහ මූලික ප්‍රශ්ණයන් මෙමගින් ඉස්මතු කෙරේ. එසේ වන්නේ මෙවැනි තත්ත්වයන් සම්බන්ධයෙන් සිවිල් බලයට සහය වනු පිණිස නීත්‍යානුකූල ලෙස හමුදාව කැඳවීමට අදාළ වන නෛතික හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය කාර්ය රාමුව සම්පූර්ණයෙන්ම නොතකා හරිමින් රජය විසින් සන්නද්ධ හමුදාවන් කැඳවීම යන සන්දර්භයෙහිදීය. මෙම නීතියෙන් පරිබාහිර තත්ත්වයෙහිදී, පොලිසියට තම නොහැකියාව හෝ වෙනත් කරුණක් නිසා නීතිය හා සාමය පිළිබඳවවූ තම වගකීම් අත හැරීමට සිදුවී හා එම තත්ත්වය තුළ විශේෂ බලකායන් හා යුද හමුදාව කැඳවීම දැන් සම්මත ක්‍රියාත්මක ක්‍රියාපටිපාටිය බවට පත්වී තිබේද? එවැනි තත්ත්වයකදී එසේ කැඳවනු ලබන්නන් හට දෙනුලබන නියෝගයන් මොනවා ද? ජීව උණ්ඩ භාවිතා කිරීමටද? වෙඩි තැබීමට හා වෙඩි තබා මරා දැමීමටද? සැබවින්ම එබඳු නියෝගයන් දෙන්නේ කවුරුන්ද? ඒ පිළිබඳව වගකීම් භාර ගන්නේ කවුරුන්ද? එහිදී ක්‍රියාත්මක ආඥා දාමය (chain of command) කුමක්ද? හා ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට පිළිතුරු දෙන්නේ කවුරුන්ද? බාධා විරහිත අධිකරණ ක්‍රියාදාමයක් සඳහා ඇති ඉඩ ප්‍රස්ථාවන් කෙබඳුද?

නව හමුදාපති වරයා විසින් තමා වැඩභාරගත් පළමු දිනයේදීම සිදුවූ මෙම ගර්හා කටයුතු සිදුවීම පිළිබඳව අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීම සඳහා නියෝග කොට ඇත. පෙනීයන ආකාරයට පොලිස් පරීක්ෂණයක් ද සිදුවෙමින් පවතී. මානව හිමිකම් කොමිසමද පරීක්ෂණයක් ආරම්භ කොට ඇත. සිදුවූ හානියට අපහාසයක් ද එකතු කරමින් රජයේ ප්‍රකාශකයන් විසින් සිදුවීම සඳහා විදේශ මැදිහත් වීමක් හා දේශපාලන පක්ෂ විසින් ප්‍රචණ්ඩත්වයට අනුග්‍රහ දක්වනු ලැබීමක් පිළිබඳව චෝදනා කිරීමක් සහ සිදුවීම් පිළිබඳව වගකීම මාධ්‍යයන් වෙත පැවරීමක්ද සිදුකර ඇතැයි කියැවෙන ප්‍රකාශයන්ද වාර්තාවේ. ශ්‍රී ලාංකිය රාජ්‍යය ජනතාවගේ ආරක්ෂකයා නොව භක්ෂකයා (Predator) බවට වේගයෙන් පත්වන බවක් පෙනී යයි. එපමණක් නොව එය තම පුරවැසියන්ගේ හොඳහිත හා යමක් ඉක්මනින් විශ්වාස කරනසුළු බව දැඩි අවඥාවකට ද ලක්කරන බවක් පෙනේ.

රටේ නීතියේ ආධිපත්‍යය සහ නීතිය හා සාමය පිළිබඳව වන බිය එලවනසුළු මට්ටමකවූ මෙම බිඳවැටීම පිළිබඳව ශ්‍රී ලාංකේය පුරවැසියන්ගේ කනස්සලු සහගත බව අස්වැසීම සඳහා මේ සිදුවීම් පිළිබඳව විශ්වාස කටයුතු, ස්වාධීන හා අපක්ෂපාතී පරීක්ෂණයකට අඩු වන කිසිවක් සමත් නොවනු ඇත. එමෙන්ම එබඳු පරීක්ෂණයක ප්‍රතිඵලද ප්‍රසිද්ධියට පත් කළ යුතු වේ. එබඳු පරීක්ෂණයක් පැවැත්වීමට හා වරද කලවුන් හට පැමිණවිය යුතු අධිකරණමය දඬුවම් පැමිණ වීමට අසමත් වීම විශාල අධිකරණමය අවගමනයක් හා අසාර්ථකත්වයක් වනු ඇත. එමෙන්ම එය රාජ්‍යයක් විසින් එහි ජනතාවන්හට සැපයිය යුතු ආරක්ෂාව නම්වූ මූලික කර්තව්‍යය ඉටු කිරීමෙහිලා වන ප්‍රධාන අසාර්ථකත්වයක් මෙන්ම ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වාර්තාව වෙත දිගින්දිගටම සිදුවන එදිරිවාදී ජාත්‍යන්තර අවධානයන් හට ආරාධනය කිරීමක්ද වනු ඇත. වැලිවේරියේදී සිදුවූ මෙම සිදුවීමට තම ප්‍රතිචාරයන් දැක්වීමේදී පූජ්‍ය පක්ෂයේ ඇතැම් අංශයන්ද ඇතුළු රජය සහ එහි දේශපාලන සගයන් මෙම කරුණු පිළිබඳව සැලකිලිමත් වීම වැඩදායක වනු ඇත.

නීතියේ ආධිපත්‍යය හා නීතිය හා සාමය පිළිබඳව වන රජයේ යම් අව්‍යාජ කැපවීමක් වේනම් එය පූර්ණ ලෙස පෙනී යන පරිදී මෙම සිදුවීම සම්බන්ධයෙන් කටයුතු කිරීම ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණයක් සහතික කිරීමෙහිලා වන රජයේ කැමැත්ත සහ හැකියාව හඟවන පියවරක් ලෙස පෙනීයනු ඇත. එය කිරීමට අසමත්වීම තුළ සිදුවනු ඇත්තේ වේගයෙන් විශාල වන ප්‍රජාතන්ත්‍රවාදයේ අඩුව තවදුරටත් වැඩිවීම මෙන්ම සමගි සන්ධානය, එකමුතුබව සහ සෞභාග්‍යය සඳහා අපට ඇති ඉඩ ප්‍රස්ථාවන් තවදුරටත් අඩුවීමයි.